# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2393/36 - 2024 ජූලි මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2024.07.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 ජූලි මස 17 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි "**2024 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

2. පසුව සංශෝධනය කරන ලද, 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/77 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි මෙයින් තවදුරටත් සංශෝධනය කෙරේ.

3. මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද, 2024 ජූනි මස 11 දිනැති අංක 24/1089/604/058-I දරන සංදේශය සඳහා 2024 මැයි මස 31 දිනැතිව ලබාදුන් අමාත්‍ය මණ්ඩලයේ තීරණය ප්‍රකාරව මෙම රෙගුලාසි නිකුත් කරනු ලැබේ;


1A - PG 6799 — 374 (2024/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. ඉහත සඳහන් කර ඇති 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල අංක 9 දරන රෙගුලාසියේ කෙසේ සඳහන්වුවද, 'තෝරාගත් කුළුබඩු ආනයනය හා සැකසුම සහ තෙල් නිස්සාරණ, ඔලියොරෙසින් හා අවශේෂ ස්වරූපයෙන් ප්‍රතිඅපනයනය කිරීම සඳහා වන ක්‍රියා පටිපාටිය' යටතේ ප්‍රකාශයට පත්කරන ලද අනුමත ව්‍යවසායයක් විසින් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක අංක හතර (04) පදනමට වෙනස් කිරීම සමගින් දේශීයව එකතු කළ අගය අවම වශයෙන් 35% කට සහ එම ක්‍රියා පටිපාටියේ අනෙකුත් නියමයන් සහ කොන්දේසිවලට යටත්ව ඉහත එම රෙගුලාසිවල V වන උපලේඛනයේ ලැයිස්තුගත කරන ලද පහත උපලේඛනයේ විස්තර කර ඇති භාණ්ඩ ආනයනය කිරීම සඳහා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ආනයන පාලන බලපත්‍ර නිකුත් කළ යුතු ය.

| | *I තීරුව සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය* | *II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III තීරුව විස්තරය* | *IV තීරුව ආනයන පාලන බලපත්‍රය (L)* |
|---|---|---|---|---|---|
| **4** | **09.04** | | | **"පයිපර්" ගණයේ ගම්මිරිස්; කැප්සිකම් ගණයේ හෝ පිමෙන්ටා ගණයේ වියලූ හෝ කුඩු කළ හෝ ඇඹරූ ගෙඩි.** | |
| | | | - | ගම්මිරිස් : | |
| | | 0904.11 | -- | කුඩු නොකළ හෝ නොඇඹරූ : | |
| | | | --- | ඝනත්වය ලීටරයට ග්‍රෑම් 450 නොඉක්මවන සැහැල්ලු ඇට සහිත ගම්මිරිස් : | |
| | | 0904.11.11 | ---- | ජෛන්ද්‍රීය | **L** |
| | | 0904.11.19 | ---- | අනෙකුත් | **L** |
| | | | | | |
| **7** | **09.08** | | | **සාදික්කා වසාවාසි සහ කරදමුංගු.** | |
| | | | - | සාදික්කා : | |
| | | 0908.11 | -- | කුඩු නොකළ හෝ නොඇඹරූ : | |
| | | | --- | ජෛන්ද්‍රීය : | |
| | | 0908.11.11 | ---- | පණුවන් ගැසූ හා තත්ත්වයෙන් බාල | **L** |
| | | 0908.11.19 | ---- | අනෙකුත් | **L** |
| | | | - | කරදමුංගු : | |
| | | 0908.31 | -- | කුඩුනොකළ හා නොඇඹරූ | **L** |
| | | 0908.32 | -- | කුඩු කළ හෝ ඇඹරූ | **L** |
| | | | | | |
| **8** | **09.10** | | | **ඉඟුරු, කුංකුම (සැප්රන්), කහ (කුර්කුමා), තයිම්, බේ කොළ, කරපිංචා සහ අනෙකුත් කුළුබඩු වර්ග** | |
| | | | - | ඉඟුරු : | |
| | | 0910.11 | -- | කුඩු නොකළ හෝ නොඇඹරූ : | |
| | | 0910.11.10 | --- | වියළි | **L** |
| | | 0910.11.90 | --- | අනෙකුත් | **L** |
| | | 0910.30 | - | කහ (කුර්කුමා) : | |
| | | 0910.30.10 | --- | කුඩු නොකළ හෝ නොඇඹරූ | **L** |
| | | 0910.30.90 | --- | අනෙකුත් | **L** |

5. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත, බලපත්‍රලාභී බැංකු වෙත සහ වෙනත් අදාළ ආයතන වෙත "මෙහෙයුම් උපදෙස්" නිකුත් කරනු ලැබිය යුතු ය.

6. ඉහත රෙගුලාසි අංක 4 යටතේ දක්වා ඇති ක්‍රියා පටිපාටියේ අර්ථානුකූලව අනුමත ව්‍යවසායෙකු සඳහා ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීමට අදාළ ඕනෑම ගැටලුවක් සම්බන්ධයෙන් ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් අවසාන තීරණය ගනු ලැබිය යුතු ය.

7. අර්ථ නිරූපණය

7.1 මෙම රෙගුලාසියේ අරමුණ සඳහා අනුමත ව්‍යවසායන් ලෙස අදහස් කරනු ලබන්නේ ඃ

"ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද, 2023 දෙසැම්බර් 06 දිනැති අංක 23/2380/631/032 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2023 දෙසැම්බර් 18 දිනැතිව ලබාදුන් අමාත්‍ය මණ්ඩලයේ තීරණය අනුව අනුමත කරන ලද 'තෝරාගත් කුළුබඩු ආනයනය හා සැකසුම සහ තෙල් නිස්සාරණ, ඔලියොරෙසින් හා අවශේෂ ස්වරූපයෙන් ප්‍රතිඅපනයනය කිරීමේ ක්‍රියා පටිපාටිය යටතේ, සංයෝජිත වර්ගීකරණ සංකේතාංක අංක හතර (04) පදනමට වෙනස් කිරීම සමගින් දේශීයව එකතුකල අගය අවම වශයෙන් 35%ක් සහිතව සැකසුම් සහ ප්‍රතිඅපනයනය කිරීමට, ඉහත රෙගුලාසි අංක 4 හි නිශ්චිතව දක්වා ඇති කුළුබඩු ආනයනය කිරීම සඳහා, ආයෝජන මණ්ඩලය හෝ ආයෝජන ප්‍රවර්ධන විෂය භාර අමාත්‍යාංශය හරහා ආයෝජන මණ්ඩලයේ නිර්දේශය මත අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ඕනෑම ව්‍යවසායක්"

EOG 07-0309

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.